## 2018 සැප්තැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"තවද යමෙක් මනුෂ්‍යයන් අභිමුවෙහි මා පිළිගත් බවට සාක්ෂි දරන්නේ ද, මනුෂ්‍ය පුත්‍රයාණෝත් දෙවියන් වහන්සේගේ දූතයන් අභිමුවෙහි ඔහු පිළිගත් බවට සාක්ෂි දරණ සේක. එහෙත් මනුෂ්‍යයන් අභිමුවෙහි මා ප්‍රතික්ෂේප කරන තැනැත්තේ දෙවියන් වහන්සේගේ දූතයන් අභිමුවෙහිදී ප්‍රතික්ෂේප කරනු ලැබේය"යි මම ඔබට කියමි**

(ශු.ලූක් 12:8-9)

ප්‍රසාද ස්නාපනය ලැබූ සෑම කිතුනුවෙකුටම දේව දරුකමේ උරුමය ලැබී ඇත. එබැවින් සෑම කිතුනුවෙකුගෙන්ම සත්‍යයට සාක්ෂි දැරීමට දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන සේක. ඊට සහය වීමට ප්‍රසාද ස්නාපනය ලබද්දීම ශුද්ධාත්මයාණන් ඔවුන්ට දානය කරන ලදී. ඒ ශුද්ධාත්මයාණන් කිතුනු කමට සාක්ෂි දැරීමට ඔවුන්ට සහය දෙන සේක. මෙවැනි වරමක් ලැබුණත් සත්‍යයට සාක්ෂි නොදරා නාමික කිතුනුවන් වශයෙන් ජීවත් වන අය දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව අද සුපුවතින් ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කරයි.

එවැනි අය අද අප මීසම්වල, ගම්වල, සභාව තුළ බොහෝ ඇත. එමනිසා අයැදීමේ සේවකයන් වශයෙන් මෙවැනි කිතුනුවන් වෙනුවෙන් ගැඹුරු මනස්ථාපනයකින් යුතුව, ලෞකික තාන්න මාන්න සඳහා කිතුනුකම පාවා නොදී සත්‍යයට සාක්ෂි දැරීමට අවැසි ශුද්ධාත්ම බලය ලැබෙන පිණිස මෙම මාසය පුරාවටම අඛණ්ඩව අයැදීමෙන් සමිඳුන් අභියස ඒ අය වෙනුවෙන් පෙනී සිටිමු.

**" අපි ඔවුන් වහන්සේ සමඟ මැරෙමු නම්, අපි ඔවුන් වහන්සේ සමඟ ජීවත් වන්නෙමු. අපි ස්ථිරව සිටිමු නම්, ඔවුන් වහන්සේ සමඟ රජකම් කරන්නෙමු. අපි ඔවුන් වහන්සේ ප්‍රතික්ෂේප කරමු නම්, ඔවුන් වහන්සේ අපත් ප්‍රතික්ෂේප කරන සේක. "** ( 2 තිමෝති 2:11-12 )

පළමු සතිය - දිව්‍යමය කියවීම : ශු.ලූක් 12:8-9

අයැදීමට විශේෂ යොමුව :

නාමික ක්‍රිස්තියානි කාරයන් ලෙස ජීවත් වන සියළුම කිතුනුවන් වෙනුවෙන් සහ තම ලෞකික අවශ්‍යතාවයන් සපයා ගැනීම සඳහා විවිධ මිත්‍යාදෘෂ්ඨික දෙවි දේවතාවන් සොයා යන කිතුනුවන්ගේ සිත් හැරීම උදෙසා අපි යාච්ඤා කරමු. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, සුසමත එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින සෑම සාංඝිකයකම පෙ.ව.10.00 - ප.ව.04.00 දක්වා දේශය වෙනුවෙන් කෙරෙන අයැදීම ශුද්ධාත්ම බලයෙන් පිරෙන පිණිස.
* සැප්තැම්බර් 08-09 දිනවල පැවැත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගි වන සියළු දෙනා සහ උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්.
* සුබැඳි, සබැඳි, සුරැඳි, සුමැදි සංඝයන් සහ ප්‍රබෝධයේ එකතුව වෙනුවෙන්.
* වෙනත් අයැදීම්......

දෙවන සතිය - දිව්‍යමය කියවීම : ජූද් 1:17-22

අයැදීමට විශේෂ යොමුව :

ජීවත් වූ කාලයේදී දේව කැමැත්තට පටහැනිව, සක්‍රමේන්තු ජීවිත ගත නොකර අද ශුද්ධිකාගිනිස්ථානයේ දුක් විඳින සියළුම ආත්මයන් වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* දහම් පාසල් නොයන සියළුම දරුවන්, දහම් පාසල් ගුරුවර-ගුරුවරියන් සහ දහම් පාසල්වලට එන දරුවන් වෙනුවෙන්.
* ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි නොවන සියළු දෙනා වෙනුවෙන්.
* පවුල් ජීවිතයේ අර්බුදවලට මුහුණ දෙන සියළු පවුල් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්......

තෙවන සතිය - දිව්‍යමය කියවීම : 1ජොහාන් 5:1-5

අයැදීමට විශේෂ යොමුව :

ශ්‍රී ප්‍රශංසාරාමයේ යාච්ඤාංගනයේ වේදිකාව ඉදිකිරීමට මුදල් ප්‍රතිපාදන අවශ්‍ය වී ඇත. එය ඉදිකිරීම සඳහා අවැසි පරිත්‍යාග ලැබෙන ලෙස යාච්ඤා කරන්න. (විනාඩි 05ක් පමණ)

වෙනත් අයැදීම් :

* ප්‍රශංසාරාමය, ධර්මාරාමය, රම්‍යාරාමය, සියළුම පුබුදු මධ්‍යස්ථානවල සහ සුබැදි දූත සේවා නිවෙස්වල කෙරෙන දූත සේවාවන් ඇතුළු ඒ ඒ ස්ථානවල කෙරෙන වැඩ කටයුතු වෙනුවෙන්.
* පුබුදු මුද්‍රණාලයේ වැඩ කටයුතු සහ එහි බාරව සිටින සියළු දෙනාත්, සේවකයනුත් වෙනුවෙන්.
* සුදතුම් ගමන සඟරාවට ලිපි සපයන සියළු දෙනා සහ එහි සංස්කරණ කටයුතු කරන කණ්ඩායම වෙනුවෙනුත්, ව්‍යාප්ති සේවාව, සුදතුම් ගමන සඟරා බෙදා හරින සියළුම මව්-පිය-දූ-පුතුන් වෙනුවෙන්.
* විදේශ රටවල පුබුදු සංඝයන් සහ එහි වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්….

සතරවන සතිය - දිව්‍යමය කියවීම : රෝම 8:18-25

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* පුබුදු දිවියෙන් ඈත් වූ සියළු දෙනා වෙනුවෙන්
* විවිධ රෝග පීඩාදියෙන් දීර්ඝ කාලීනව වේදනා විඳින සියළු දෙනා වෙනුවෙන්
* සිරගත වූවන් සහ ඔවුන්ගේ දූ දරුවන් වෙනුවෙන්
* මත්පැන්, මත් ද්‍රව්‍යයන්වලට ඇබ්බැහි වී සිටින සියළු දෙනා සහ එවැනි ජාවාරම්කරුවන් සියළු දෙනාටම ඉන් වැලකෙන ලෙසට
* වෙනත් අයැදීම්…..

**නිතරම ප්‍රීති වන්න !**

**නොකඩවා යාච්ඤා කරන්න !!**

**සියල්ලේදී ස්තූති දෙන්න !!!**

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************